සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

09 ශ්‍රේණිය

## බුද්ධ ධර්මය - I

**නම / විභාග අංකය :-..............................................................** **කාලයඃ පැය 02 යි**

- **නිවැරදි හෝ වඩාත්ම ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01) වේරංජාවෙහි වස් කාලය තුළ නිසි අහරක් නොලැබීම, අක්කෝසක භාරද්වාජ, චිංචි මානවිකාව ආදීන්ගේ ක්‍රියා කලාපය හමුවේ නොසැලීම බුදු සිරිතෙහි,

(1) අකම්පිත බව යි. (2) ඍජු බව යි.
(3) කාරුණික බව යි. (4) අගතිගාමී නොවීම යි.

02) බුදු රජාණන් වහන්සේ ජීවමානව වැඩ සිටියදීම පැවිදිව රහත් වූ අන්තිම ශ්‍රාවකයා වීමේ භාග්‍ය උදා කර ගත්තේ,

(1) ආනන්ද තෙරණුවෝ ය. (2) සුභද්‍ර පිරිවැජියා ය.
(3) ධම්මාරාම තෙරණුවෝ ය. (4) උපාලි ගෘහපතියා ය.

03) ඥාති හිතමිත්‍රාදීන් ආදී ආගන්තුක සංග්‍රහයක් වුව ද, පිළිගැන්වීමට සුදුසු වන මහා සංඝරත්නය සතු ගුණය නම්,

(1) දක්ඛිණෙය්‍ය. (2) පාහුණෙය්‍ය.
(3) ආහුණෙය්‍ය. (4) අංජලිකරණීය.

04) බුදු රජාණන් වහන්සේගේ වම් සිරිපා ලකුණ පිහිට වූ ශ්‍රී පාදස්ථානය පිහිටියේ,

(1) සබරගමුව පළාත රත්නපුර දිස්ත්‍රික්කයේ ය.
(2) ඌව පළාත බදුල්ල දිස්ත්‍රික්කයේ ය.
(3) උතුරු මැද පළාත අනුරාධපුර දිස්ත්‍රික්කයේ ය.
(4) නැගෙනහිර පළාත අම්පාර දිස්ත්‍රික්කයේ ය.

05) පරිපූර්ණ මිනිසෙකු වීමට හා අවසානයේ සාංසාරික විමුක්තිය ලබා ගැනීමට ප්‍රධාන වශයෙන් ඉවහල් වන්නේ,

(1) කායික දියුණුවයි. (2) මානසික දියුණුවයි.
(3) ආර්ථික දියුණුවයි. (4) සංස්කෘතික දියුණුවයි.

06) සම්බුද්ධ ශාසනයේ චිරරාත්‍රඥ භික්ෂුණීන් අතර අගතැන්පත් වූයේ,

(1) භද්දකච්චානා තෙරණිය යි. (2) කුමාර කාශ්‍යප මාතාව යි.
(3) මහා ප්‍රජාපතී ගෝතමී තෙරණිය යි. (4) උප්පලවණ්නා තෙරණිය යි.

07) අසත්පුරුෂයා තමා පමණක් පිරිහෙන්නේ නොවේ. ඔහු ආශ්‍රිත සමාජය ද පරිහානියට යොමු කරන බවට බුද්ධ කාලීන නිදසුනකි.

(1) දෙව්දත් තෙරුන්ගේ ක්‍රියාකලාපය.
(2) අජාසත් කුමරුගේ ක්‍රියාකලාපය.
(3) චුල්ල උපාසකගේ ක්‍රියා කලාපය.
(4) චුන්ද සූකරගේ ක්‍රියාකලාපය.

08) අන් අයගේ දියුණුව දැක එම දියුණුව තමාට ඇති වූවක් සේ සලකා සතුටට පත් වන ස්වභාවය,

(1) මෛත්‍රිය යි. (2) කරුණාව යි.

(3) මුදිතාව යි. (4) උපේක්ෂාව යි.

09) ආර්ය අෂ්ටාංගික මාර්ගයේ සීල ශික්ෂාවට අයත් මාර්ගාංග වන්නේ,

(1) සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, , සම්මා කම්මන්ත (2) සම්මා ආජීව, සම්මා වාචා, සම්මා කම්මන්ත

(3) සම්මා වාචා, සම්මා ආජීව, සම්මා වායාම (4) සම්මා සති, සම්මා ආජීව, සම්මා වාචා

10) සිගාලෝවාද සූත්‍රයට අනුව සේවකයෙකු විසින් ස්වාමියා කෙරෙහි ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳව වැරදි ප්‍රකාශය තෝරන්න.

(1) ස්වාමියාට පළමුව අවදි වීම. (2) ස්වාමියාට පළමුව නිදා ගැනීම.

(3) ස්වාමියා දුන් දෙය පමණක් ගැනීම. (4) වැඩ කටයුතු ඉතා මැනවින් ඉටු කිරීම.

11) අපගේ දියුණුව පවතින්නේ අප සතු සම්පත් ප්‍රමාණය මත නොව උත්සාහය මත බව ආදර්ශයෙන් පෙන්වා දුන්නේ,

(1) මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි ය. (2) වාරියපොල සුමංගල හිමි ය.

(3) හික්කඩුවේ සුමංගල හිමි ය. (4) බලංගොඩ ආනන්ද මෛත්‍රිය නා හිමි ය.

12) බුදු, පසේ බුදු, මහරහතන් වහන්සේලාට,

(1) මානසික දුක් නැත (2) කායික දුක් නැත

(3) කිසිදු දුකක් නැත (4) කායික හා මානසික යන දෙයාකාර දුකම ඇත

13) සියල්ල මරණයෙන් කෙළවර වෙයි. මතු පැවැත්මක් හෝ පුනර්භවයක් නැත. එම නිසා හැකිතාක් සැප විඳීමට ඇති ආශාව,

(1) කාම තණ්හාවයි. (2) භව තණ්හාවයි.

(3) විභව තණ්හාවයි. (4) ත්‍රිවිධ තණ්හාවයි.

14 සම්මා කම්මන්තයට අයත් වන පිළිතුර වන්නේ,

(1) ව්‍යාපාදයෙන් වෙන්වීමේ සංකල්පනාවයි.

(2) අනුන් රවටන බොරු කීමෙන් වැළකී සත්‍ය කතා කිරීමයි.

(3) සතුන් මැරීමෙන් හා සත්ත්ව හිංසාවෙන් වැළකීමයි.

(4) නූපන් කුසල් උපදවා ගැනීමට දරන වෑයමයි.

15 රජගහ නුවර වාසය කළ ශාස්තෘන්ගෙන් කර්මය හා විපාකය යන දෙකම ප්‍රතික්ෂේප කළ ශාස්තෘවරයා වන්නේ,

(1) පකුධ කච්චායන (2) අජිත කේශකම්බලී

(3) පූර්ණ කස්සප (4) මක්ඛලීගෝසාල

16 හේතුඵල දහමෙහි "ඉමස්ස උප්පාදා ඉදං උප්පජ්ජති" යන පාඨයේ අර්ථය නම්,

(1) මෙය ඇති කල්හි මෙය වේ.

(2) මෙය හට ගැනීමෙන් මෙය හටගනී.

(3) මෙය නැති කල්හි මෙය නැත.

(4) මෙය නැතිව යාමෙන් මෙය නැතිව යයි.

(5)

17 පමණ ඉක්මවා ආහාර ගැනීමෙන් වන අනර්ථය පිළිබඳ බුදු රජාණන් වහන්සේ කරුණු වදාළේ,

(1) බිම්බිසාර මහ රජතුමාට ය. (2) කොසොල් මහ රජතුමාට ය.

(3) සුදත්ත සිටුතුමාට ය. (4) උදේනි රජතුමාට ය.

18 වජ්ජිපුත්තක භික්ෂූන්ගේ දස අකැප වස්තුව නිසා පැවැත් වූ ධර්ම සංගායනාව වන්නේ,

(1) පළමුවන ධර්ම සංගායනාවයි. (2) දෙවන ධර්ම සංගායනාවයි.

(3) තෙවන ධර්ම සංගායනාවයි. (4) සිව්වන ධර්ම සංගායනාවයි.

19 සද්ධර්මරත්නාවලිය, පූජාවලිය, කව්සිළුමිණ ආදි ග්‍රන්ථ රචනා වූ යුගය වන්නේ,

(1) අනුරාධපුර යුගයයි. (2) දඹදෙණි යුගයයි.

(3) කුරුණෑගල යුගයයි. (4) කෝට්ටේ යුගයයි.

20 සුන්දරී පරිබ්‍රාජිකාව මුල් කර ගත් සිදු වීමට බුදු රජාණන් වහන්සේ අපවාදයට ලක් වූයේ පෙර භවයේ,

(1) මූනලී නම් ධූර්තයකුව ඉපිද සරභූ නම් පසේ බුදු රදුන්ට කළ අපහාසය නිසා ය.

(2) නන්ද නම් ශ්‍රාවකයන් වහන්සේට "කාම භෝගියා" යයි දොස් නැගීම නිසාය.

(3) පෙර මසුන් මරණ පවුලක ඉපිද සිටියදී තම ඥාතීන් මසුන් ගොඩ දානු දැක සතුටට පත් වූ නිසා ය.

(4) වෛද්‍යවරයෙක්ව ඉපදී සිටියදී ද්වේශයෙන් විරේක බෙහෙත් දී මුදල් ලබා ගැනීමේ හේතුව නිසා ය.

(ලකුණු 02 x 20 = 40)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

09 ශ්‍රේණිය

## බුද්ධ ධර්මය - II

**නම / විභාග අංකය :-**........................................................

- පළමු ප්‍රශ්නය **ඇතුළුව** ප්‍රශ්න පහකට **පමණක්** පිළිතුරු ලියන්න.

1.

i. බුදු රජාණන් වහන්සේ සැදැහැතියන් විසින් දැක ධර්ම සංවේගය උපදවා ගත යුතු යැයි පෙන්වා දුන් ස්ථාන දෙකක් නම් කරන්න.

ii. කියන දේ කරන හා කරන දේ කියන ගුණය දහමේ හඳුන්වන ආකාරය ලියන්න.

iii. හුස්ම ගැනීම හා පිට කිරීම පිළිබඳ මනා සිහියෙන් සිදු කරන භාවනාව නම් කරන්න.

iv. එකවර අසංඛ්‍ය කල්ප ලක්ෂයක් ආත්මභාවයන් සිහි කිරීමට සමත් අභිඥා (විශිෂ්ඨ ඥානයක්) පහළ වූ භික්ෂුණිය නම් කරන්න.

v. ත්‍රිකෝටි පාරිශුද්ධිය අංග තුනකින් හෙවත් තුන් ආකාරයකින් සීලය ආරක්ෂා කිරීමයි' එයින් කරුණු දෙකක් ලියන්න.

vi. සිගාලෝවාද සූත්‍රයෙහි ගිහි - පැවිදි, සේව්‍ය - සේවක, සම්බන්ධතාව දක්වා ඇති දිශා දෙක නම් කරන්න.

vii. සියලු සංස්කාරයන් සන්සිඳීම සියලු, බැඳීම් අත් හැරීම, තෘෂ්ණාව සම්පූර්ණයෙන්ම නැති කිරීම... යන්නට ධර්මයේ යෙදෙන වචනය ලියන්න.

viii. දස අකුසල කර්ම වල සිතින් සිදු කරන අකුසල කර්ම තුනෙන් දෙකක් ලියන්න.

ix. දෙවන ධර්ම සංගායනාවට මූලිකත්වය ගත් මහරහතන් වහන්සේ නම් කරන්න.

x. වන්දනා ගමන් වලදී "තුන් සරණය" කවි කීමෙන් ජනතාව බලාපොරොත්තු වන කරුණු දෙකක් ලියන්න.

(ලකුණු 2 x 10 = 20)

2.

i. බුද්ධ චරිතයෙහි දැකිය හැකි විශිෂ්ටම ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 02)

ii. එක් විශිෂ්ට ලක්ෂණයක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03)

iii. බුද්ධ චරිතයෙහි ඇති විශිෂ්ට ලක්ෂණ ශිෂ්‍ය ජීවිතය වඩාත් යහපත් කර ගැනීම සඳහා අදාළ කරගත හැකි ආකාරය විස්තර කරන්න. (ලකුණු 05)

3.

i. මහා ප්‍රජාපතී ගෝතමී තෙරණියට ලැබුණු අගතනතුර නම් කරන්න. (ලකුණු 02)

ii. මහා ප්‍රජාපතී ගෝතමී තෙරණියගෙන් සිදු වූ ප්‍රධාන සේවය කාන්තාවන්ට පැවිදි බව ලබා ගැනීමට ක්‍රියා කිරීමයි. එය සිදු කළ ආකාරය කෙටියෙන් ලියන්න. (ලකුණු 03)

iii. මහා ප්‍රජාපති ගෝතමියගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ විස්තර කරන්න. (ලකුණු 05)

4.

i. අත්තනාව කතං පාපං - අත්තනා සංකිලිස්සති... යන ධම්මපද ගාථාව සම්පූර්ණ කරන්න. (ලකුණු 02)

ii. එම ගාථාවේ තේරුම ලියන්න. (ලකුණු 03)

iii. යහපත් පුද්ගලයෙක් නිර්මාණය වීමට ඉහත ධම්මපද ගාථාවෙන් ගත හැකි ආදර්ශ විස්තර කරන්න.

(ලකුණු 05)

5.

i. අනුරාධපුර අටමස්ථාන වලින් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ii. වන්දනා ගමන් වලදී නොකළ යුතු නොමනා කටයුතු තුනක් ලියන්න. (ලකුණු 03)

iii. වන්දනා ගමන්වල දී අනුගමනය කළ යුතු සිරිත් විස්තර කරන්න. (ලකුණු 05)

6.

i. "චේතනාහං භික්ඛවේ කම්මං වදාමි. චේතයිත්වා කම්මං කරෝති, කායේන වාචාය මනසා". මෙහි සිංහල තේරුම ලියන්න. (ලකුණු 02)

ii. දස අකුසල්වල ඇතුළත් අකුසල ක්‍රියා තුනක් ලියන්න. (ලකුණු 03)

iii. අකුසලයෙන් වැළකී කුසල කර්ම කිරීමට අප පුරුදු පුහුණු විය යුතු වන්නේ ඇයි දැයි විස්තර කරන්න.(ලකුණු 05)

7. පහත මාතෘකා වලින් දෙකක් තෝරා ගෙන කෙටි සටහන් ලියන්න. (එක් කොටසකට ලකුණු 05 කි)

i. තෙවන ධර්ම සංගායනාව.

ii. වැවයි දාගැබයි - ගමයි පන්සලයි

iii. අනාණ සැපය

iv. බලංගොඩ මහා නායක හාමුදුරුවෝ

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 09 - ශ්‍රේණිය

## බුද්ධ ධර්මය - පිළිතුරු පත්‍රය

| | |
|---|---|
| 1 - 1 | 11 - 4 |
| 2 - 2 | 12 - 1 |
| 3 - 2 | 13 - 3 |
| 4 - 1 | 14 - 3 |
| 5 - 2 | 15 - 4 |
| 6 - 3 | 16 - 2 |
| 7 - 1 | 17 - 2 |
| 8 - 3 | 18 - 2 |
| 9 - 2 | 19 - 2 |
| 10 - 2 | 20 - 1 |

(ලකුණු 02 x 20 = 40)

II කොටස

1.

i. බුදුන් වහන්සේ උපන් ස්ථානය
සම්බුද්ධත්වය ලැබූ තැන
දම්සක් දෙසූ තැන
පිරිනිවී තැන (මින් දෙකක්)

ii. යථාවාදී තථාකාරී - යථාකාරී තථාවාදී බව

iii. ආනාපානසති භාවනාව

iv. භද්දකච්චානා හෙවත් යසෝදරා තෙරණිය

v. පව් නොකිරීම, පව් නොකර වීම, අන් අය කරන විට අනුමත නොකිරීම

vi. උඩ දිසාව හා යට දිසාව

vii. නිර්වාණය / නිවන

viii. දැඩි ලෝභය (අභිජ්ඣාව) තරහව (ව්‍යාපාදය) වැරදි විශ්වාසය (මිථ්‍යාදෘෂ්ටිය)

ix. සබ්බකාමී මහරහතන් වහන්සේ

x. පාළුව, කාන්සිය, විඩාව දුරු කරවා ගැනීම, ශ්‍රද්ධාව ජනනය වීම. (ලකුණු 02 x 10 = 20)

02.

i. ආදර්ශවත් බව, චරිතවත් බව, යථාවාදී තථාකාරී හා යථාකාරී තථාවාදී බව, සමානාත්මතාවය, අකම්පිත බව, කාරුණික බව, අගතිගාමී නොවීම, නම්‍යශීලීත්වය, ඍජු බව, නිවැරදි තීරණ ගැනීම, නිවැරදි දැක්ම, ආකර්ෂණීය වාග් විලාසය, ආකර්ෂණීය රූප විලාසය, ස්ථානෝචිත ප්‍රඥාව, බහුශ්‍රැත බව (මින් දෙකක්) (ලකුණු 02)

ii. පෙළ පොතේ 2 පාඩමට අනුව ලියන ලද කරුණු දෙකට ලකුණු ලබා දෙන්න. (ලකුණු 03)

iii. බුදුරජාණන් වහන්සේගේ චරිතයෙහි ඇති විශිෂ්ට ලක්ෂණ තම ශිෂ්‍ය ජීවිතය වඩාත් යහපත් කර ගැනීම සඳහා ඉවහල් කර ගන්නා ආකාරය විස්තර කර ඇති පිළිතුරට සුදුසු ලකුණු ලබා දෙන්න. (ලකුණු 05)

03.

i. චිරරාත්‍රඥ භික්ෂුණියන් අතර අග්‍රස්ථානය (ලකුණු 02)

ii. මුලින්ම කාන්තාවන්ට පැවිදි බව ලබා දෙන්න යැයි ආයාචනා කළත් එය බුදුරජාණන් වහන්සේ විසින් ප්‍රතික්ෂේප කරන ලදී. පසුව ශාක්‍ය කුමාරිකාවන් පන්සිය දෙනෙකු සමඟ කසාවත් හැඳ හිස මුඩු කර පා ගමනින් ඉතා දුර බැහැර පිහිටි කූටාගාර ශාලාවට යාම සිදුකළේය.එහි දී ආනන්ද හිමියන්ගේ මැදිහත් වීම මත අෂ්ට ගරු ධර්ම පිළිගැනීමෙන් පසු පැවිද්ද ලැබීය. (ලකුණු 03)

iii. ගුණගරුක මවක් වීම, අධිෂ්ඨාන පූර්වකව කටයුතු කිරීම, වඩාත් සාමකාමී පිළිවෙතින් ඉල්ලීම් දිනා ගැනීම සිදු කිරීම, අනතිමානී ගුණයෙන් යුක්ත වීම, නිසි නායකත්වය හා කැපවීම, නිරහංකාර බව යන කරුණු විස්තර කර ඇති පිළිතුරට ලකුණු ලබා දෙන්න. (ලකුණු 05)

04.

i. අත්තනාව කතං පාපං - අත්තනා සංකිලිස්සති
අත්තනා අකතං පාපං - අත්තනාව විසුජ්ඣති
සුද්ධි අසුද්ධි පච්චත්තං - නාඤ්ඤෝ අඤ්ඤං විසෝධයේ

ii. තමා විසින්ම කරන ලද පාපය තමා කිලිටි කරන්නේ ය. තමා විසින් නොකරන ලද පාපය තමා පිරිසිදු කරයි. පිරිසිදු බව හා අපිරිසිදු බව තම තමා අතම පවතී. කෙනෙක් තව කෙනෙකු පිරිසිදු නොකරයි. (ලකුණු 03)

iii. පස්පවින් වැළකීම, දස අකුසලයෙන් වෙන්වීම, පරාභව කරුණු වලින් බැහැර වීම වැනි කරුණු මූලික කර ගනිමින් විවිධ කටුක තත්වයන් විඳදරා ගනිමින් තමා යහපත්ව ජීවත්වීම පුද්ගලයා යහපත් වීමට ඉවහල් වන බව සිහි තබා ගනිමින් කටයුතු කළ යුතුය. සෑම දෙනා ඇප කැපවීම තුළින් තම ජීවිතය උසස් මට්ටමකට පත් කර ගැනීමට කටයුතු කළ යුතුය. බුද්ධධර්මය පෙළ පොතේ 7 පාඩම ඇසුරෙන් ලියා ඇති පිළිතුරකට ලකුණු ලබා දෙන්න. (ලකුණු 05)

05.

i. රුවන්වැලි මහා සෑය, අභයගිරිය, ශ්‍රී මහා බෝධිය, ථූපාරාමය, මිරිසවැටිය, ජේතවනාරාමය, ලංකාරාමය, ලෝවා මහාපාය (මින් දෙකක්)

ii. පූජනීය ස්ථානවල නම් ගම් සටහන් නොකිරීම
අනවශ්‍ය ශබ්ද නැගීම් නොකිරීම
නුසුදුසු ආහාරපාන භාවිතයෙන් වැළකීම
නොගැලපෙන වදන් භාවිතයෙන් වැළකීම, නුසුදුසු ගීත ගායනයෙන් හා වාදනයෙන් වැළකීම.
ස්ථානයේ ගෞරවයට හානි වන කිසිවක් නො කිරීම

iii. ගමේ පාසලේ දී තෙරුවන් පුදා හාර වීම

වන්දනා කාලය තුළ නිර්මාංසව සිටීම

සංවර ඇඳුමින් සැරසීම

වන්දනා කවි පමණක් ගායනා කිරීම

පූජා ද්‍රව්‍ය රැගෙන යාම (25 පිටුවේ ඇතුලත් කරුණු වලට අදාළ පිළිතුරු) (ලකුණු 05)

06.

i. 'මහණෙනි, මම චේතනාව කර්මය යැයි කියමි. සිතින් සිතා කයින් වචනයෙන් හා මනසින් කර්ම රැස් කරයි. (ලකුණු 02)

ii. පර පණ නැසීම, පරුෂ වචන කීම, සොරකම් කිරීම, හිස් වචන කීම, කාමයෙහි වරදවා හැසිරීම, ඇඩි ලෝභය, බොරු කීම, තරහව, කේලම් කීම, වැරදි විශ්වාසය. (ලකුණු 03)

iii. පුද්ගලයා සිදුකරන කුසලාකුසල කර්මවල විපාක සසර පුරාවටම ලැබේ. කිසියම් භවයක උපත ලැබීමට ද අතීත කර්ම ද ඉවහල් වේ. තිරිසන් ලෝකයෙහි, ප්‍රේත ලෝකයෙහි, මනුෂ්‍ය ලෝකයෙහි, දිව්‍යලෝකයෙහි උපත ලැබීමට හේතු වන්නේත් එම ලෝකවලට අදාල දුක හෝ සැප විඳීමට මූලික වන්නේත් අප විසින් සිදු කරනු ලබන කුසලාකුසල කර්ම හේතු වන නිසා අප අකුසලයෙන් වැළකී කුසල කර්ම සිදු කළ යුතු වන්නේ ය. (ලකුණු 05)

07.

i. තෙවන ධර්ම සංගායනාව

ලාභ ප්‍රයෝජන අපේක්ෂාවෙන් මිථ්‍යා දෘෂ්ඨික පිරිස් භික්ෂු වෙස් ගැනීමෙන් උපන් ගැටලු නිසා මොග්ගලීපුත්තතිස්ස හිමියන්ගේ මූලිකත්වයෙන් ධර්මාශෝක රජුගේ අනුග්‍රාහකත්වයෙන් පැළලුප් නුවර අශෝකාරාමයේ බුද්ධ පරිනිර්වාණයෙන් අවුරුදු 236 කට පසුව තෙවන ධර්ම සංගායනාව සිදු කිරීම.

(20 පාඩම 126 පිටුව)

ii. පෙළ පොතේ 13 පාඩම ඇසුරෙන් ලියා ඇති පිළිතුරකට ලකුණු ලබා දෙන්න. වැව හා දාගැබ ආශ්‍රයෙන් ශ්‍රී ලාංකික ජන ජීවිතය සංවර්ධනය වූ ආකාරය පන්සල ආශ්‍රයෙන් ජනතාවගේ ආධ්‍යාත්මික සංවර්ධනය සිදු වූ ආකාරය පැහැදිලි කිරීම අවශ්‍ය වේ.

iii. අනණ සැපය -

බුදු දහමේ අනණ සැපය යනු ණය නොවීම නිසා ඇති වන සැපයයි.ආදායමට වඩා වියදම් කිරීම නිසා බොහෝ දෙනෙක් ණය ගනිති.ඒවා ගෙවා දැමීමටත් තව තවත් ණය ගැනීමට සහහරු පෙළඹෙති.මෙම හේතුව නිසා ණය කරුවෙක් වී සමාජයට පවා මුහුණ දීමට පවා නොහැකව සිටීමට සිදුවේ.ණය දුන් පුද්ගලයන් ණය ඉල්ලා නඩු මගටද යයි.එවිට ණය ගත් පුද්ගලයාට ගැටලුවලට මුහුණ දීමට සිදුවෙයි.මේ අනුව ණය නොගෙන ආදායමට අනුව වියදම සමව පවත්වා ගනිමින් ණය නොවී ජීවත් වීම පුද්ගලයාට සැපයකි.

iv. බලංගොඩ ආනන්ද මෛත්‍රිය මහා නා හිමියන්ගේ ළමා කාලය පැවිදි වීම, තනතුරු කරන ලද සේවය විස්තර කර ඇති පිළිතුරකට ලකුණු ලබා දෙන්න.